ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2020 මැයි 19** |

## සියලු ණය සේවාකරණ වගකීම් ඉටු කිරීමට ඇති කැපවීම ශ්‍රී ලංකාව යළිත් අවධාරණය කරනු ලබයි

තම ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට ඇති හැකියාව සම්බන්ධයෙන් මෑත කාලීන මාධ්‍ය වාර්තා මගින් ප්‍රශ්න කරමින් විවිධ අනුමානයන් ඉදිරිපත් කර ඇති බව රජයට පෙනී ගොස් ඇත. ශ්‍රී ලංකාව ස්වෛරී ණය අර්බුදයකට පත් වීමේ අවදානමක් ඇති බව ඇඟවීම සඳහා එවැනි තත්ත්වයන්ට පත්ව ඇතැයි පැවසෙන වෙනත් ස්වෛරී රාජ්‍යයන් සමග සංසන්දනය කරමින් සමහර මාධ්‍යයන් විසින් සිදු කරනු ලබන අනුමානයන් පිළිබඳව රජය සිය අප්‍රසාදය පළ කරනු ලබයි. ශ්‍රී ලංකා රජය විසින් මෙවැනි පදනම් විරහිත ප්‍රකාශයන් තරයේ ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඉදිරියේදී සිදු කිරීමට නියමිත සියලුම ණය සේවාකරණ ගෙවීම් නියමිත කාලයට සිදු කරනු ලබන බවට සියලු පාර්ශ්වකරුවන් වෙත නැවත නැවතත් අවධාරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල ඵලදා අනුපාතිකයන්හි සිදු වූ මෑත කාලීන විචලනයන්, කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ නැගී එන සහ ප්‍රමුඛ වෙළඳපොල ආර්ථික බහුතරයක් තුළ දක්නට ලැබෙන තත්ත්වයන්ට වඩා වෙනස් නොවේ. එවැනි විචලන තත්ත්වයක් යටතේ වුවද, ගෝලීය ආයතනික ආයෝජකයින්, අරමුදල් කළමණාකරුවන් සහ විශ්ලේෂකයින් විසින් ශ්‍රී ලංකාවේ ණය කළඹෙහි ගුණාත්මකභාවය පිළිබඳ ඉහළ විශ්වාසයකින් ආයෝජන සඳහා ශ්‍රී ලංකා ණය උපකරණ නිර්දේශ කිරීම සැලකිය යුතු කරුණකි.

මහ මැතිවරණය පැවැත්වීම සහ රාජ්‍ය අයවැය ඉදිරිපත් කිරීම අනපේක්ෂිත ලෙස කල් දැමීමට සිදුවීම, අවිනිශ්චිත ප්‍රතිපත්තිමය සැලසුමක් හෝ ක්‍රියාපටිපාටිමය අත්හිටුවීමක් ලෙස කිසිදු විටක නොසැළකිය යුතු බවත්, එම ක්‍රියාමාර්ග කෝවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය පාලනය කිරීමට අනුගමනය කරනු ලැබූ සෞඛ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිචාරයන්හි ප්‍රතිඵලයක් බවත් රජය විසින් පැහැදිලි කරනු ලබයි. තවද, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වාර්ෂික අයවැයක් සම්මත කර නොමැති අවස්ථාවක දී මහ මැතිවරණයකින් පසු නව පාර්ලිමේන්තුව කැඳවා මාස තුනක කාලයක් දක්වා රාජ්‍ය මෙහෙයුම් කටයුතු සඳහා අනුමැතිය ලබා දීමට අතිගරු ජනාධිපතිවරයාට බලය

ඇත. මේ අනුව, රාජ්‍ය මෙහෙයුම් කිසිදු බාධාවකින් තොරව ක්‍රියාත්මක වන අතර, මහ මැතිවරණය පවත්වනු ලබන දිනය හා සම්බන්ධ අවිනිශ්චිතතා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ පිළිබඳව ලබා දීමට නියමිත තීන්දුවෙන් පසුව පහව යනු ඇත.

මීට සමගාමීව, වියදම් අඩුකිරීම සඳහා රජය විසින් දැනටමත් පියවර ගෙන ඇති අතර, රජයේ අයවැය ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම නිසා මෙම වසරේ අමතර වියදම් සඳහා ඇති අවකාශය නිතැතින්ම සීමා වනු ඇත. තවද, මෙම වසරේ මේ දක්වා කාලය තුළදී දේශීය හා විදේශීය ප්‍රභවයන්ට අදාළ රජයේ මූල්‍යන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වී තිබේ. මූල්‍යනය නියමයන් හා කොන්දේසි ඵලදායී ලෙස වැඩි දියුණු කිරීම සඳහා පූර්වෝපායී ක්‍රියාමාර්ග ලෙස වෙළඳපොළ පදනම් කරගත් විවිධ මූල්‍ය ප්‍රභවයන්ගෙන් සහ නිල මූල්‍ය ප්‍රභවයන්ගෙන් අරමුදල් රැස් කර ගැනීමට රජය විසින් පියවර ගන්නා ලදී. ලොව පුරා පවතින අස්ථාවර වෙළඳපොළ තත්ත්ව යටතේ රජය විසින් මෑත කාලීනව ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කිරීමට අපේක්ෂා නොකරන බැවින් ජාත්‍යන්තර බැඳුම්කර වෙළඳපොළේ පවත්නා ඵලදායිතා අනුපාතිකයන්හි බලපෑම අදාල නොවනු ඇත. ණය කළමනාකරණයෙහි අවදානම සහ පිරිවැය මත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික මූල්‍යන මූලාශ්‍ර පිළිබඳව අවධානය යොමුකරනු ලබන අතර, මේ සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. තවද, ශ්‍රී ලංකාව අනෙකුත් කලාපීය මහ බැංකු සමඟ හුවමාරු ගිවිසුම්වලට (SWAP) එළඹීමට කටයුතු කරමින් සිටින අතර, තෝරාගත් විදේශීය මූලාශ්‍රයන්ගෙන් ඒකාබද්ධ ණය ලබා ගැනීමටද කටයුතු සූදානම් කෙරෙමින් පවතී.

මේ අතර, කොවිඩ්-19 වසංගතය පැතිර යාමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ඇති වූ බලපෑම අපේක්ෂා කළ කාලයට පෙර යථා තත්ත්වයට පත්වීම, ඉදිරි කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් ඒකාග්‍රතාව ඇති කිරීමට රජය ගන්නා උත්සාහයන්ට සහය ලබාදෙනු ඇත. ආර්ථික කටයුතුවලට අවම බලපෑමක් ඇතිවන පරිදි, කෙටි කාලයක් තුළ වසංගතය පැතිරීම සාර්ථකව පාලනය කිරීමට ශ්‍රී ලංකාවට හැකිව තිබේ. ශ්‍රී ලංකාව මාර්තු මස දෙවන භාගය, අප්‍රේල් මස, සහ මැයි මස පළමු භාගය යන සති අටක කාල සීමාවක් සඳහා අර්ධ වශයෙන් සංචරණ සීමා පනවන ලදී. මෙම කාලය තුළදී ද බොහෝ කාර්යාල, මූල්‍ය ආයතන, කර්මාන්තශාලා, බෙදාහැරීමේ සේවා, කෘෂිකාර්මික සේවා, රාජ්‍ය සේවා ආදිය ක්‍රියාත්මක විය. සෑම වසරකම අප්‍රේල් මාසය උත්සව සමයක් වන නිසා මෙම කාලසීමාව තුළදී ආර්ථික ක්‍රියාකාරකම් නිතැතින්ම පහළ මට්ටමක පවතී. රජය සහ මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද උත්තේජන ක්‍රියාමාර්ග තුළින්, වසංගතය පැතිරීයාමෙන් පීඩාවට පත් වූ පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට කඩිනමින් නැවත නැගී සිටීමට සහය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 1.5ක පමණ වර්ධනයක් අපේක්ෂා කරන අතර, එයින් වැඩි ප්‍රමාණයක් වසරේ දෙවන භාගයේ දී සිදුවනු ඇත.

ශ්‍රී ලංකාවේ අපනයන හා සංචාරක අංශ කඩිනමින් යථා තත්ත්වයට පත්වීමට සූදානම් වෙමින් සිටින අතර, එමඟින් විදේශීය අංශයට ඇති පීඩනය ලිහිල් කෙරෙමින් ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් යථා තත්ත්වයට පත් කිරීමට සහය වනු ඇත. නවතම වෙළඳපළ තොරතුරු වලට අනුව, සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා කර්මාන්තශාලාවලට නව අතිරේක ඇණවුම් ලැබී තිබේ. ප්‍රධාන ආනයනකරුවන්ගේ පැවති ඉහළ ඉල්ලුම හේතුවෙන්, තේ වැනි ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අපනයන භාණ්ඩ සඳහා වෙන්දේසි වලදී වාර්තාගත ඉහළ මිලක් ලැබී තිබේ. අමතර සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය කරමින් සංචාරකයින් නැවත පිළිගැනීම සඳහා ඉක්මනින් නැවත කටයුතු ආරම්භ කිරීමට හෝටල් සූදානමින් සිටී. එපමණක් නොව, ඉන්ධන ආනයන වියදමේ අඩු වීම සහ අත්‍යවශ්‍ය නොවන වෙළඳ භාණ්ඩ ආනයනය සඳහා පනවා ඇති තාවකාලික සීමාවන්

වෙළඳ ශේෂයට ඇති අහිතකර බලපෑම අවම කිරීමට පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අනුව, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් සංචාරක, ප්‍රවාහන අංශය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කෙරෙහි තාවකාලික අහිතකර බලපෑම් ඇති වුවද, වෙළඳ ගිණුමේ හිඟය පහළයෑම මඟින් 2020 වසරේ දී ජංගම ගිණුමේ හිඟය පහළ මට්ටමකින් පවත්වා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පදනම් විරහිත අනුමානයන් සහ සැසඳීම් වලට පටහැනිව, ශ්‍රී ලංකාව යථා තත්ත්වයට පත්වීමට දැනටමත් පියවර ගෙන ඇති අතර ක්‍රමිකව රට පුරා ව්‍යාපාර විවෘත වෙමින් පවතී. මෙම පසුබිම තුළ, ඇතැම් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් මෑත කාලීනව කරන ලද අවදානම් තක්සේරු කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ තීරණ පිළිබඳව ශ්‍රී ලංකා රජය නිසැකවම එකඟ නොවේ.

අවසාන වශයෙන්, අතීතයේ දුෂ්කර කාල සීමා වලදී පවා ශ්‍රී ලංකාව සිය සියලු ණය සේවාකරණ වගකීම් නියමිත කාලය තුළ සිදු කිරීමට ඇති කැපවීම පෙන්නුම් කර ඇති ආකාරයෙන්ම අනාගතයේදී ද සියලුම ආයෝජන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සම්බන්ධ වෙමින් එම වගකීම් අඛණ්ඩවම ඉටු කරන බව රජය අවධාරණය කරනු ලබයි.